
# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ✻ 2016 මැයි ✻ මෙත් සවිය දහහතර වන කාණ්ඩය ✻ විසිඅට වන කලාපය

METHSAVIYA NEWSLETTER






## 13 වන සංවත්සරය

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



මෙත් සවිය
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය
හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලිම
මෙත් සවිය විසින් අරඹන ලදී.
ඇස්තමේන්තු ගත මුදල
රුපියල් ලක්‍ෂ 350 ක්
පමණ වේ.
මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න
☎ 0714 0144 67, 0112 50 50 88
office@methsaviya.org

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org


## මෙත් සවිය 2015 වසර සඳහා පත් වූ විධායක කමිටුව

### ගරු පැවිදි අනුශාසක

ගරු පැවිදි අනුශාසක, ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත,
වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක
අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

### ගරු සභාපති

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා
අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී
මහාචාර්ය චන්දන ජයරත්න මහතා.
දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

### ගරු උප සභාපතිවරු

වෛද්‍ය කාංචන ඇලපාත මහතා.
වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා.

### ගරු සම ලේකම්වරු

එච්. එම්. චින්තක බණ්ඩාර මහතා.
දු.ක : 0718114477
කෝසල එදිරිසිංහ මහතා.
දු.ක : 0716322306

### ගරු භාණ්ඩාගාරික

චමින්ද ඉන්දික මහතා.
දු.ක : 0712299212

### ගරු උප භාණ්ඩාගාරික

ඉන්දික තෙන්නකෝන් මහතා.

### ගරු සංස්කාරක

එම්. කේ. ප්‍රියන්ත මහතා
දු.ක : 0712285680

### ගරු කාරක සභිකවරු

සුරංග ලියනගේ මහතා
සම්පත් රත්නතිලක මහතා
මෙනුර ඩයස් මහතා
දර්ශන ගලප්පත්ති මහතා
ඩබ්. පී. සී. විතාන මහතා
ජගත් ප්‍රසන්න මහතා

### වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති

මංජුල පද්මකුමාර මහතා

### බුදු පිළිම කමිටුව - සභාපති

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

### කාන්තා කමිටුව - සභාපතිනිය

රංජනී උඩුගොඩ මහත්මිය

### තරුණ කමිටුව - සභාපති

ප්‍රසාද් අබේසිංහ මහතා

### අසරණ සරණ කමිටුව - සභාපතිනිය

ශ්‍යාමා සමරවීර මෙනවිය

### සුව සෙත කමිටුව - සභාපතිනිය

ප්‍රභාත් විජේසිංහ මහතා

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහතුනකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි.** වර්තමාන සාමාජික සංඛ්‍යාව 4500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරි කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය පවත්වා ගනිමින් **"මෙත් සවිය"** මෛත්‍රී සංසදය පසුගිය දහතුන් වසර පුරා සමථ විපස්සනා භාවනාව හාරදහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 2016 මැයි 11 මහියංගන රාජමහා විහාර භූමියේ තැනෙන බුදු පිළිමය ඉහළට නැංවීමේ හතරවන අදියර ආරම්භය.

මේ සඳහා බුදුපිළිම කමිටුවේ සාමාජිකයන් සහභාගී වනු ඇත. සියළු සාමාජිකයන් ජූලි 03 දා රැගෙන යනු ලැබේ.

### 2016 මැයි 15 අපේක්ෂා රෝහලේ (පිළිකා රෝහලේ) ළමා වාට්ටුවට දානය

වෙසක් උත්සවය නිමිති කොට මහරගම අපේක්ෂා රෝහලේ ළමා වාට්ටුවට අවශ්‍ය කිරිපිටි ඇතුළු ද්‍රව්‍ය බෙදා දීම උදේ 10.00 ට සිදුකෙරේ. මේ සඳහා සහභාගී වීමට කාර්යාලය වෙත අමතන්න.

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 2016 ජුනි 5 වන දින මාසික රැස්වීම හා පුද්ගල ප්‍රවර්ධන වැඩමුළුව

ඉතා වටිනා මෙම වැඩසටහන සඳහා සියළුම දෙනාගේ පැමිණීම බලාපොරොත්තු වේ. ප්‍රවීන පුද්ගල ප්‍රවර්ධන (Personality development) සම්පත් දායකයකු වන ප්‍රියන්ත මුතුතන්ත්‍රී මහතා විසින් සියළු සාමාජිකයින් වෙත පෞරුෂ වර්ධනය හා පුද්ගල ප්‍රවර්ධන වැඩසටහනක් 2016/06/05 ප්‍රථම ඉරුදින මාසික රැස්වීම් දිනයේ දී ප.ව. 2.00 - 5.00 දක්වා කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේ දී පැවැත්වේ.

## 2016 ජුනි 12 ඉරුදින<br>34 වන භාවනා හා චිත්ත සංයම අභ්‍යාස වැඩසටහන ආරම්භය

මීළඟ භාවනා හා චිත්ත සංයම අභ්‍යාස වැඩසටහන ජුනි 12 වන ඉරුදින ප.ව. 2.00 ට ආරම්භ වේ. ඒ සඳහා ඉල්ලුම් පත් 2016 මැයි 22 දක්වා භාර ගැනේ. මේ සඳහා සහභාගී වීමට බලාපොරොත්තු වන සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින් හට 2016 මැයි 22 දිනට ප්‍රථම ඒ බව කාර්යයාලයට දැනුම් දෙන්න.

## මීළඟ දාන - සීල - භාවනා සදහම් චාරිකාව

අති පූජ්‍ය මඩවල උපාලි ස්වාමීන්වහන්සේ වැඩසිටින සෞම්‍ය පරිසරයක පිහිටි, ඔබට ද විවේක අවස්ථාවලදී ගොස් නැවතී භාවනා කල හැකි ඇල්ල, කිතල් ඇල්ලේ (බණ්ඩාරවෙල) රත්මල්කන්ද භාවනා මධ්‍යස්ථානයේ දී 2016 ජූලි මස 03 වන ඉරු දින මෙත්සවිය මීළඟ දාන - සීල - භාවනා වැඩසටහන පැවැත්වීමට බලාපොරොත්තු වේ.

**වැඩි විස්තර සඳහා 8 වන පිට බලන්න.**

## 2016 අගෝස්තු මස පැවැත්වෙන දින 8 ක නේවාසික භාවනා පුහුණු වැඩසටහන

දෙවන වරටත් පැවැත්වෙන මෙත් සවිය නේවාසික භාවනා වැඩසටහන කාන්තා - පිරිමි දෙපාර්ශවය සඳහාම වෙන වෙන ම ශාලාවල පැවැත්වීටම සැලසුම් කර ඇත. අගෝස්තු පාසල් නිවාඩු කාලය තුල පැවැත්වෙන මෙම වැඩසටහන සඳහා සහභාගී විය හැක්කේ මෙත්සවිය සාමාජිකයිනට පමණි. අයැදුම් පත් දැන් භාරගැනේ. පිරිමි හා කාන්තා උපරිම 10 දෙනා බැගින් තෝරාගනු ලැබේ.

භික්ෂූන් වහන්සේලාට, මෙහෙනින් වහන්සේලාට සහ භාවනා යෝගින් හට මෙම දින 8 තුල දානය (හීල් දානය, දහවල් දානය සහ ගිලන් පස දානය) දීමට කැමති පිංවතුන් කරුනාකර තම නම හා දුරකථන අංකය කාර්යාලයේ ඒ සඳහා ඇති පොතෙහි සටහන් කරන්න.

## 2016 සැප්තැම්බර් 7 වන පළමු ඉරුදින මාසික රැස්වීම හා ධර්ම දේශනාව

කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේ පැවැත්වෙන ඉහත වැඩසටගන සඳහා ප්‍රවීන ධර්ම කථික කුකුල්පනේ සුදස්සි හිමිට ආරාධනා කොට ඇත.

## 2016 සැප්තැම්බර් 14 වන ඉරුදින නොමිලයේ පැවැත්වෙන වෛද්‍ය සායනය හා ලේ දන්දීමේ පුණ්‍ය වැඩසටහන

වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී පෙ.ව. 9.00 - ප.ව. 2.00 දක්වා පැවැත්වෙන ඉහත පුණ්‍ය වැඩසටගන සඳහා දායකත්වය ලබාදිය හැකි වෛද්‍ය වරුන්, හෙද හෙදියන් හා බර පැන දැරිය හැකි පිංවතුන් වෙත්නම් කාර්යාලයට තම නම ලිපිනය හා දුරකථන අංකය ලබාදෙන්න.

## මෙත් සවිය දිවි සරණ සේවාව

ස්වයං රැකියාවක් ඇරඹීම සඳහා මුදල් නොමැති මෙත් සවිය සාමාජිකයකු හෝ ඔහු/ඇය විසින් අනුමත කරන්නකු වේ නම් ඒ සඳහා පොලී රහිත ණය මුදලක් ලබා දී දිවිය නගා සිටුවීමට අතහිත දීමට අප පිංවතුන් කිහිප දෙනෙකු හරහා මෙම වැඩසටහන දියත් කොට ඇත. දැනට රු. 10,000/- දක්වා ණය මුදල ලබාදෙන අතර ඒ සඳහා විමසීම් වෙතොත් සමලේකම් - චින්තක බණ්ඩාර මහතා වෙත යොමු කරන්න.

## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

## මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් 2016 - 09 -15 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

## පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

## සුව සෙත

ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින් රෝග සුවකිරීමේ නොමිලයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන ඉරු දිනවල දී,

පෙ.ව. 11.00 - 2.00 දක්වා<br>(මාසයේ පළමු ඉරු දින හැරෙන්නට)<br>ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ.

කාර්යයාලයෙන් හෝ කමිටු සභාපති **ප්‍රභාත් විජේසිංහ (0777 328 565) මහතාගෙන් විමසා පැමිණෙන්න.**

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 13 වන සංවත්සර වාර්තාව

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 03 වන ඉරු දින පස්වරු 1.30 ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී, මෙත්සවිය සංසදයේ දහතුන්වෙනි සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ උපහාර ප්‍රධානෝත්සවයේ සමාරම්භක උළෙල උත්කර්ශවත් අයුරින් ඇරඹුනි. මෙහිදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ වර්තමාන කථානායක ගරු කරූ ජයසූරිය මැතිතුමාට සහභාගී වීමට නියමිතව තිබුණු නමුදු නොවැලක්විය හේතුවක් මත එතුමාට පැමිණීමට නොහැකි විය. එතුමා ලිපියක් මගින් එතුමාගේ සුභාශිංසනය දන්වා එවන ලදී.

ප.ව. 2.00 ට මෙත්සවිය සංසදයේ 13 වන සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ උපහාර ප්‍රධානෝත්සවයේ සමාරම්භය සනිටුහන් කරමින් මෙත්සවිය සංසදයේ ගරු සභාපති නාලන්දා කීර්ති ශ්‍රී, ශාසනදීපන, විද්‍යාකීර්ති මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් විසින් පංචතූර්ය, ජයසක් නාද මධ්‍යයේ ආරාධිත අමුත්තන් සහ මෛත්‍රී භූෂණ ලාභීන් සභාගැබ වෙත වැඩම කරවාගෙන එන ලදී.

අනතුරුව සාම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන් දැල්වීම හා ජාතික ගීය ගායනා කීරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඤාණිස්සර ස්වාමීන් වහන්සේ වෙත මූලාසනය පිළිගැන්වීම සිදුවිය. උන් වහන්සේ විසින් පැමිණ සිටි පිරිස ආජීව අෂ්ඨමක ශීලයේ පිහිටුවන ලද අතර පසුව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ගරු අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ කෙටි අනුශාසනාවක් පවත්වා පැමිණ සිටි පිරිසට සහ මෙත්සවිය සියලූ සාමාජිකයින්ට ආශිර්වාද කරන ලදී. ඉක්බිතිව මෙත්සවිය සංසදයේ සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් විසින් ආරාධිත අමුත්තන් ඇතුළු පැමිණ සිටි සියළු දෙනා මෙත් සිත් පෙරදැරිව පිළිගන්නා ලදී.

මෛත්‍රී භූෂණ සම්මාන ප්‍රදානය කිරීම මින් අනතරුව ආරම්භ විය. පළමුව මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ට සේවය හා ප්‍රවීණත්වය උදෙසා පිරිනැමෙන මෙත්සවිය මෛත්‍රී භූෂණ ගෞරව උපහාර සම්මානය වන මෛත්‍රී භූෂණ ශ්‍රී සද්ධර්ම චක්‍රවර්ති ගෞරව නාම සම්මානය ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඤාණිස්සර ස්වාමීන් වහන්සේ වෙත පිරිනැමීම, අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේ සහ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සිදුකරන ලදී. දෙවනුව මෙත්සිත් මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ට සේවය හා ප්‍රවීණත්වය උදෙසා පිරිනැමෙන මෙත්සවිය මෛත්‍රී භූෂණ ගෞරව උපහාර සම්මානය වන මෛත්‍රී භූෂණ වෛද්‍ය චක්‍රවර්ති ගෞරව නාම සම්මානය පූජ්‍ය අම්තිරිගල පාලිත ධම්ම ස්වාමීන් වෙත පිරිනැමීම ද, අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේ සහ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සිදුකරන ලදී. පසුව මෛත්‍රී භූෂණ ලාභී ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඤාණිස්සර ස්වාමීන් වහන්සේ විසින් හරවත් අනුශාසනාවක් පවත්වා සියලූ දෙනාට ආශිර්වාද කරන ලදී. දෙවනුව පූජ්‍ය අම්තිරිගල පාලිතධම්ම ස්වාමීන් වහන්සේ උන්වහන්සේ විසින් ද දේශනාවක් පවත්වා පිරිසට ආශිර්වාද කරන ලදී.

ඉනික්බිතිව හොරණ විදුසිළු රංගායතනයේ දරුදැරියන් විසින් විචිත්‍රවත් නර්තනයක් ඉදිරිපත් කරන ලදී. පසුව මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් ගරු කථානායක තුමාගේ පණිවිඩය සභාවට ඉදිරිපත් කරන ලදී. මෙත්සවිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය මීළඟට ආරම්භ විය. මෙහිදී අසරණ පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් 17 දෙනෙක් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව හා අධ්‍යාපන උපකරණ කට්ටලයක් ලබාදීම මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් විසින් සිදු කිරීමට යෙදුනි.

මෙත්සවිය සංසදයේ උන්නතිය උදෙසා නිලතල තනතුරු නොමැතිව අපරිමිත කැපවීමකින් කටයුතු කරන සාමාජිකයින් ඇගයීම සඳහා විශේෂ ඇගයීමේ සම්මාන ලබාදීම මීලගට සිදුවිය. මෙහිදී තමරා සමරදීර, ශ්‍යාමා සමරදීර, අයිමා ජයවීර, පියදාස සිල්වා සහ ප්‍රියන්ත මුතුතන්ත්‍රී යන මහත්ම මහත්මීන් ඇගයීමට ලක් කෙරුණි. තවද මෙත්සවිය කමිටු සාමාජිකයින් සහභාගී වූ නායකත්වය සහ පුද්ගල සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සාර්ථකව නිමකළ සාමාජිකයින්ට සහතික පත්‍ර පිරිනැමීම මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා සහ වැඩමුළුවේ ප්‍රධාන සම්පත් දායකයා වූ ප්‍රියන්ත මුතුතන්ත්‍රී මහතා අතින් සිදුවිය.

මීළඟට මෙත්සවිය මාසික ධර්ම දේශනාව පූජ්‍ය තුම්බෝවිල යසස්සී ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලදී. මෙයින් අනතුරුව පැමිණ සිටි සියළු දෙනා සඳහා තේ පැන් සංග්‍රහයක් පැවැත්වීමෙන් පසුව මෛත්‍රී භූෂණ සම්මාන උළෙලේ නිමාව සිදුවිය.

## මෙත්සවිය
## 13 වෙනි මහ සමුළුවේ වාර්තාව

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 03 වන ඉරු දින පස්වරු 5.00 කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී, මෙත්සවිය 13 වන මහා සමුළුව ගරු පැවිදි අනුශාසක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේද, මෙත්සවිය නිර්මාතෘ, මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. පළමුව 12 වන සාංවත්සරික මහසභාවේ වාර්තාව මෙත්සවිය සංසදයේ ගරු සභාපති තුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලැබිණි. එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට චමින්ද ඉන්දික මහතා යෝජනා කල අතර පී. පී පෙරේරා මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉන් පසුව මෙත්සවිය 2015/2016 වර්ෂය තුල සිදු කෙරුණු ක්‍රියාකාරකම් පිළිබඳ ශංෂික්ප්ත වාර්තාවක් සභාවට ඉදිරිපත් කල අතර එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සුරංග ලියනගේ මහතාගේ හා රන්ජිත් සොයිසා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පිළිගනු ලැබුණි. අනතුරුව මෙත්සවිය සංසදයේ ගරු උප භාණ්ඩාගාරික ඉන්දික තෙන්නකෝන් මහතා විසින් 2015 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමට යෙදුනි. ඉදිරිපත් කල අයවැය වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සුරංග ලියනගේ මහතාගේ හා ඩබ්ලිව්.ඩී.සී පෙරේරා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

අනතුරුව මෙත්සවිය ව්‍යවස්ථානුකූලව මෙත්සවිය සංසදයේ සභාපති තුමා ඇතුළු නිලධාරී මණ්ඩලය දරණ තනතුරුවලින් ඉල්ලා අස්වූ අතර ඉදිරි වසර සඳහා මෙත්සවිය සංසදයේ සභාපති ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මහතා තෝරා පත් කර ගන්නා ලදී. තවද උපසභාපති වරුන් ලෙස වෛද්‍ය කාංචන ඇලපාත මහතා හා වෛද්‍ය එම්. ඒ. චන්දිම මාරසිංහ මහතා ද සම ලේකම් තනතුරු සඳහා චින්තක බණ්ඩාර මහතා සහ කෝසල එදිරිසිංහ මහතා ද භාණ්ඩාගාරික ලෙස චමින්ද ඉන්දික මහතාද උප භාණ්ඩාගාරික ලෙස ඉන්දික තෙන්නකෝන් මහතාද සංස්කාරක ලෙස එම්. කේ ප්‍රියන්ත මහතාද තෝරා පත් කරගන්නා ලදී. කාරකසභික වරුන් ලෙස සම්පත් රත්නතිලක, මෙනුර ඩයස්, ඩබ්ලිව්. පී. සී විතාන, දර්ශන ගලප්පත්ති, සුරංග ලියනගේ, ජගත් ප්‍රසන්න යන මහත්වරුන් තෝරාපත් කරගන්නා ලදී. තවද වෙබ් කමිටු සභාපති ලෙස මංජුල පත්මකුමාර රණසිංහ මහතාද, බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස පී. ප්‍රේමදාස පෙරේරා මහතා ද, කාන්තා කමිටුවේ සභාපතිනිය ලෙස රංජිනී උඳුගොඩ මහත්මියද, තරුණ කමිටුවේ සභාපති ලෙස ප්‍රසාද් අබේසේකර මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිනිය ලෙස ශ්‍යාමා සමරදීර මෙනවියද, සුවසෙත කමිටුවේ සභාපති ලෙස ප්‍රභාත් විජේසිංහ මහතා තෝරාපත් කරගන්නා ලදී.

නිලධාරී මණ්ඩලය තෝරාගැනීමෙන් අනතුරුව මෙත්සවිය සංසදයේ සමාගම් ලේකම් ධූරය දැරූ දිනේෂ් අමරසූරිය මහතාද එම ධූරයෙන් ඉල්ලා අස් වූ අතර නව සමාගම් ලේකම්වරයා ලෙස රොබට් හේවගේ මහතා තෝරාපත් කරගන්නා ලදී. එසේම විගණනකවරුන් ලෙසට පෙර සිටි විගණනකවරුන් වන **MKJ Associates** (වරලත් ගණකාධිකාරීවරු) නැවතත් 2016 වර්ෂය සඳහාද ඒකමතිකව තෝරාපත් කරගන්නා ලදී.

## 2015-04-05 සිට 2016-04-3 කාලය දක්වා මෙත්සවිය මඟින් සිදුකල ක්‍රියාකාරකම් වල සංක්ෂිප්ත වාර්තාව

- මෙත්සවිය මාසික රැස්වීම සහ පූජ්‍ය හම්බන්තොට ආනන්ද ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනාව (2015-05-03).
- මෙත්සවිය නායකත්ව හා පුද්ගල සංවර්ධනය පිළිබඳ පළමු වැඩමුළුවේ ආරම්භය. මෙහිදී 80 කට ආසන්න සාමාජික පිරිසක් සහභාගී විය (2015-06-14) .
- මෙත්සවිය ත්‍රෛමාසික දාන සීල භාවනා වැඩසටහන කඳුබොඩ සුමතිගල නාහිමි අනුස්මරණ ආරණ්‍ය සේනාසනයේ පැවැත්වීම (2015-07-05).
- මෙත්සවිය සාමාජිකයන්ට ඇඟිලි සලකුණු මඟින් පැමිණීම ලකුණු කිරීමේ යන්ත්‍රයක් ස්ථාපනය කිරීම (2015-07-12).
- පූජ්‍ය ඇත්කඳුරේ සුමනසාර ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනාව සහ මාසික රැස්වීම (2015-08-02).
- 32 වන චිත්ත සංයමය සහ භාවනා වැඩසටහන නව සාමාජිකයින් 160 පමණ සහභාගීත්වයෙන් ආරම්භ කිරීම (2015-08-23).
- මෙත්සවිය තරුණ කමිටුවේ මූලිකත්වයෙන් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ ඉදිකෙරුණු සක්මන් මලුව විවෘත කිරීම (2015-08-23).
- මෙත්සවිය මාසික රැස්වීම සහ දයාරෝහණ අතුකෝරල මහතාගේ දේශනාව (2015-09-06).
- කොළඹ ජාතික රෝහලේ හෘදරෝග ඒකකයට අවශ්‍ය උපකරණ පරිත්‍යාග කිරීම (2015-09-08).
- Sight N style ආයතනයේ සහ මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ දායකත්වයෙන් අක්ෂි සායනය සහ නොමිලේ ඇස් කණ්නාඩි බෙදාදීම. 175 කට ආසන්න පිරිසකට ඇස් කණ්නාඩි බෙදා දෙන ලදී (2015-09-13).
- හඟුරන්කෙත චන්ද්‍රරතන ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනාව සහ මාසික රැස්වීම (2015-10-04).
- නේපාලයේ සුකුමසීල හිමිගේ ධර්මදේශනාව සහ මාසික රැස්වීම (2015-11-01).
- කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයේ ඉදිකෙරෙමින් පවතින නව භාවනා මධ්‍යස්ථානයේ භාවනා කුටියක් තැනීමට ආධාර පිණිස මෙත්සවිය t-shirt අලෙවිකිරීම ඇරඹීම (2015-11-01)
- මෙත්සවිය e-sms සේවාව ස්ථාපනය කිරීම (2015-11-06).
- ත්‍රෛමාසික දාන සීල භාවනා වැඩසටහන රාජගිරිය කලපලුවාව තපෝවන ආරණ්‍යයේ දී සාමාජික සාමාජිකාවන් 200 කට වැඩි පිරිසක් සහභාගිව පැවැත්වීම (2015-12-06)
- වසරේ ප්‍රථම හීල් දානමය පින් කම හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම සහ කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් කෑම ලබාදීම. පසුව ජයන්ති ළමා නිවාසයේ දරුවන් හුණුපිටිය ගංගාරාමයේ ආගමික වැඩ සටහන් සඳහා කැඳවාගෙන යාමට අවශ්‍ය ප්‍රවාහන පහසු කම් ලබා දීම (2016-01-01)
- 33 වන චිත්ත සංයමය භාවනා වැඩසටහන නව සාමාජිකයින් 197 පිරිසකගේ සහභාගීත්වයෙන් ආරම්භ කිරීම (2016-01-17).
- නායකත්වය සහ පුද්ගල සංවර්ධනය පිළිබඳ වැඩමුළුවේ අවසන් වැඩසටහන කළුතර බෝම්බුවල වී පර්යේෂණායතන පරිශ්‍රයේ දී පැවැත්වීම මෙහිදී සාමාජික සාමාජිකාවන් 44 සහතික පත්‍රය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී (2016-02-04).
- පොල්ගහවෙල අම්ලසිරි භික්ෂු විවේකාරාමයේ වයෝවෘද භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීම සහ අවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම. මෙම කටයුත්ත මෙත්සවිය තරුණ කමිටුව සහ අසරණ සරණ කමිටු වල පූර්ණ සහයෝගයෙන් සිදුකෙරුණි (2016-02-06).
- පූජ්‍ය ගොම්බද්දල දමිත හිමිගේ ධර්ම දේශනාව සහ මාසික රැස්වීම (2016-02-07).
- සාර්ථකව ඉගෙන ගන්න අන්දම සහ විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුව බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේ පැවැත්වීම මේ සඳහා සාමාජිකයින් සහ සාමාජික නොවන පිරිස 500ක් පමණ සහභාගී විය (2016-03-06).

කථානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
சபாநாயகர், இலங்கை பாராளுமன்றம்
Speaker, Parliament of Sri Lanka

**පාර්ලිමේන්තුවේ කථානායක**
**කරු ජයසූරිය මැතිතුමාගේ සුබ පැතුම් පණිවුඩය.**

"මෙත් සවිය" සංවිධානයේ දහතුන් වන සංවත්සරය සැමරීම හා මෛත්‍රී භූෂණ උපහාර පිරි නැමීමේ උළෙල නිමිත්තෙන් අපගේ සුබ පැතුම් පළ කරනුයේ ඉතා සතුටිනි.

අප මෛත්‍රිය පදනම් වූ ආගමක් මත ගොඩ නැගුනු සංස්කෘතියක හිමිකරුවන් වන අතර බුදුන්වහන්සේ විසින්දේශනා කොට වදාරණ ලද කරණීය මෙත්ත සූත්‍රය ඇතුළු සූත්‍ර දේශනාවන්හි ඉගැන්වීම් වලට අනුගත වූවන් වෙමු. වෛරයෙන් වෛරය නොසංසිඳෙන බවත් අවෛරයෙන් පමණක් වෛරය සංසිඳෙන බවත් බුදුන් වහන්සේ දෙසූහ. ලොව පැවැත්ම මුළුමනින්ම පාහේ පවතින්නේ මෛත්‍රිය මතයි. මෛත්‍රිය නොමැති වූ තැන ගැටුම් ඉස්මතුව ඔවුනොවුන් ඇණ කොටා ගැනීම නියමයයි. එසේ හෙයින් මෛත්‍රිය ජීවිතයේ පෙරගමන් කරු බැව් සියල්ලන් දත යුතුයි. "මෙත් සවිය" ඉලක්ක කොට ඇත්තේ මේ බැව් පැහැදිලිය.

අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් හා මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ නිර්මාතෘත්වයෙන්ද ආරම්භ කරන ලද මෙත් සවිය 'මනස' ඉලක්ක කොට ස්ථාපිත සංවිධානයකි. වත්මන් සංකීර්ණ ජන සමාජයේ හැල හැප්පීම් හා නානාවිධ මාධ්‍යයෙන් වියරු වැටෙන තරුණ මනස දමනයකරනු සඳහා සමථ, විදර්ශනා භාවනා කෙරෙහි තරුණ පිරිස් යොමු කිරීම මෙම සංවිධානයේ ප්‍රයත්නයයි. වත්මන් තරුණ මනස ආතතියෙන් ගලවා ගැන්ම අත්‍යාවශ්‍ය කරුණක් බව පෙනෙනුයේ දිනපතා අප අසන හා දකින පුවත් නිසාය. මෙම සංවිධානයේ සේවය මෙරට පමණක් නොව ලොව පුරා තරුණ පිරිස් කෙරෙහි ව්‍යාප්ත කළ හැකි නම් එය ලෝක ප්‍රජාව ත්‍රස්තවාදයෙන් මුදා ගැන්මට පිටුවහලක් වනු ඇත.

මෙත් සවිය භාවනා වැඩසටහන් වලට සීමාවූවක් නොවේ. රටපුරා නා නා ආගමික හා සාමාජික සංවර්ධන හා ප්‍රජා සේවාවන්හි නිර්ලෝභී පුරෝගාමී මෙහෙවරක් ඉටු කරන සංවිධානයකි. මිරිසවැටි චෛත්‍යයේ සලපතල මළුව ගල් ඇතිරීම හා නාගදීප, මහියංගනය, කිලිනොච්චියේ ලුම්බිණී විහාරය ආදී ස්ථානයන්හි සුවිශේෂ කටයුතු වල යෙදුන එය රිජ්වේ ළමා රෝහලේ අවශ්‍යතා සපුරා ඇත.

වසර දහයක් පුරා මෛත්‍රී සංසදය ඉටු කළ මෙම සද්කාර්යයනට අමතරව අසූ හාර දහසක් ධර්ම ස්කන්ධය පිහි කෙරෙන අඩි 84 ක් උසැති බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමද ආරම්භ කොට තිබීම විශේෂත්වයකි.

මේ සියළු කරුණින් ප්‍රකට වනුයේ අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමියන් හා මහාචාර්ය චන්දන ජයරත්න මහතා සමග ඒකරාශිව කටයුතු කරන ශ්‍රද්ධාවන්ත බුද්ධිමතුන් පිරිසකට නිසි මග පෙන්වීමක් සිදුවී ඇති බවයි. මෙම සංවිධානයේ ආදර්ශය අප රටට ආඩම්බරයකි.

මෙම ප්‍රීතිමත් අවස්ථාවේ සංවිධානයේ කටයුතු සියළු ආකාරයෙන් සපල වේවායි ප්‍රාර්ථනය කරමි.

කරු ජයසූරිය
පාර්ලිමේන්තුවේ කථානායක

## මෙත්සවිය 13 වෙනි සංවත්සරය සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල සඳහා දායකත්වය ලබා දුන් සාමාජිකයින්

| | | |
|---|---|---|
| දර්ශන ගලප්පත්ති මහතා | : | රු. 50,000.00 |
| චමින්ද ඉන්දික මහතා | : | රු. 50,000.00 |
| මංජුල පද්මකුමාර මහතා | : | රු. 50,000.00 |
| චින්තක බණ්ඩාර මහතා | : | රු. 50,000.00 |
| මහාචාර්ය චන්දන ජයරත්න මහතා | : | රු. 15,000.00 |
| වජිරා චිත්‍රානි මෝතා මහත්මිය | : | රු. 10,000.00 |
| වෛද්‍ය කාංචන ඇලපාත මහතා | : | රු. 10,000.00 |

# 2016 ජාත්‍යන්තර මාංශ භෝග පිළිබඳ වර්ෂය

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය 2016 වර්ෂය ජාත්‍යන්තර මාංශ භෝග පිළිබඳ වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. තිරසාර ආහාර නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ දී මාංශ භෝගවලට ඇති වටිනාකම මෙන්ම මාංශ භෝග වල ඇති ඉහළ පෝෂණ ගුණය සහ සෞඛ්‍යමය වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ජාත්‍යන්තර මාංශ භෝග වර්ෂය ප්‍රකාශ කිරීමේ මුඛ්‍ය අරමුණ වේ. මේ ජාත්‍යන්තර මාංශ භෝග වර්ෂයේ තේමාව වනුයේ "තිරසාර අනාගතයක් වෙනුවෙන් පෝෂණීය බීජ වර්ග" යන්නයි. දියවැඩියාව, අධික රුධිර පීඩනය සහ ස්ථූලතාවය වැනි බෝ නොවන රෝග වැළැක්වීමේ මාංශ භෝග සතු හැකියාව මෙන් ම මාංශ භෝග උත්පාදනය ඉහළ දැමීම මගින් ආහාර සුලභතාවය ඇති කොට එමගින් තිරසාර ලෙස ආහාර සුරක්ෂිතතාවය ඇති කළ හැකිය යන්නත්, පෝෂණ ඌණතා සහ කුසගින්න තුරන් කිරීමේ දී ඇති ප්‍රායෝගික හැකියාව පිළිබඳවත් පුළුල් කතිකාවතක් ඇති කිරීම ජාත්‍යන්තර මාංශ භෝග වර්ෂය ප්‍රකාශයට පත් කිරීම මගින් අපේක්ෂා කෙරේ.

## මාංශ භෝග යනු මොනවා ද?

වියළි ඇට ලෙස පරිභෝජනයට ගන්නා රනිල කුලයේ භෝග, මාංශ භෝග යනුවෙන් හැඳින්වේ. පරිප්පු (රතු පරිප්පු, මයිසූර් පරිප්පු සහ වටානා පරිප්පු) සෝයා බෝංචි කඩල, මුං ඇට, කව්පි, සහ උඳු ශ්‍රී ලංකාවේ බහුලව පිරිභෝජනය කරන මාංශ භෝග වේ.

## මාංශ භෝග වල සෞඛ්‍යමය වටිනාකම.

- ඉහළ ශාක ප්‍රෝටීන් සනත්වයකින් යුක්ත වන අතර තන්තු, විටමින් සහ ඛණිජ වර්ග ද බහුල ව ඇත.
- ආහාර ජීර්ණ පද්ධතිය හා සම්බන්ධ ආබාධ වන අජීර්ණ තත්ත්ව සහ මලබද්ධයට ගුණදායක වේ.
- මාංශ භෝගවල ප්‍රෝටීන බහුල නිසා ශාකහාරී ආහාර රටාවක් සහිත (Vegitarian) පුද්ගලයින් ට මාංශ භෝග ඉතා වැදගත් ප්‍රෝටීන ප්‍රභවයක් වේ.
- මාංශ භෝග වල මේදය අවම මට්ටමක පවතී. රුධිරයේ කොලෙස්ටරෝල් මට්ටම අඩු කරන නිසා මාංශ භෝග පරිභෝජනයෙන් ස්ථූලතාවය ඇති නොවේ.
- රුධිරයේ සීනි මට්ටම පාලනය කරයි.
- තරුණබව රැකදේ.
- පිළිකා වැනි රෝග ඇති නොවේ.

පෝෂණීය ආහාර නිරෝගී ජීවිතයක පදනම වේ. අහිතකර ආහාර රටාව විවිධ රෝගාබාධයනට හේතු වන අතර නොයෙකුත් ශාරීරික අපහසුතාවන් ද ඇති කරයි. පෝෂ්‍යදායී සහ සමබල ආහාර වේලක මාංශ භෝග අත්‍යාවශ්‍ය අංගයක් වේ.

**- ලංකාදීප පුවත්පත ඇසුරිනි -**

# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2015. 11. 09 සිට 2016. 03 . 17 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-1037 | එල්.ගාල්ලගේ | | 100 |
| 14/A-1038 | චම්පානි ප්‍රේමචන්ද්‍ර මිය. | 16-2787 | 100 |
| 14/A-1041 | තිලින මදූෂාන් මයා | 33-5205 | 100 |
| 14/A-1039-1040 | එස්.මධුබගේ මයා | | 200 |
| 14/A-1042,1043,1044 | පරිත්‍යාග | | 300 |
| KETA 0536 | ඉන්දික හෙරත් මයා. | 28-4856 | 494 |
| 14/ C-0275 | සාරංග චන්ද්‍රසෝම මයා | | 500 |
| 14/ C-0276 | එම්.ඩබ්.අනුලා මිය. | | 500 |
| 14/ C-0477 | සංජීව ආර්.මුහන්දිරම් මයා | | 500 |
| 14/ D-248 | කෝසල එදිරිසිංහ මයා. | 24-3709 | 1,000 |
| 14/ D-0007 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 1,000 |
| 14/ D-0249 | තරංග රාජපක්ෂ මයා | 25-3829 | 1,000 |
| 14/ D-0283 | ජ්.ඩී.එම්.ආනන්ද තෙන්නකෝන මයා | 33-5171 | 1,000 |
| 14/ D-0284 | සංජීවනී කරුණාරත්න මිය | 33-5087 | 1,000 |
| 14/ D-0285 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 1,000 |
| 14/ D-0286 | රුක්ෂාන් දිසානායක මයා | 33-5054 | 1,000 |
| 14/ D-0287 | කුමාරි කරුණාරත්න මිය | | 1,000 |
| 14/ D-0288 | රන්ජය ගුණවර්ධන මයා | 33-5206 | 1,000 |
| 14/ D-0289 | සුමින්ද කවුඩවත්ත මයා | | 1,000 |
| 14/ D-0290 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 1,000 |
| 14/ D-0261 | චමක කවුඩවත්ත මයා | 33-5109 | 1,000 |
| 14/ D- | විශාකා සුධර්ශනී මිය | 31-4816 | 1,000 |
| KETA-0546 | කසුන් වගීෂ රාජපක්ෂ මයා | | 1,000 |
| KETA-0547 | ලෙසංදූර් මන්ත මයා | | 1,000 |
| KETA -539 | චන්ද්‍රිකා ද සිල්වා මිය. | 25-3843 | 1,500 |
| KETA - 542 | එම්.ඩබ්.ජී.පී.මනෝහරී මිය | 33-5197 | 1,500 |
| 14/ D-0276-277 | ඉන්ද්‍ර මාලනී පෙරේරා මිය. | 01-229 | 2,000 |
| 14/ D-028-279 | ඉන්ද්‍ර නෝනිස් ප්‍රනාන්දු මිය | 27-4140 | 2,000 |
| 14/ D-0246-247 | සාරංග චන්ද්‍රසෝම මයා | | 2,000 |
| KETA -540 - 541 | විශ්වනාත් අපොන්සු මයා සහ එම මහත්මිය. | | 2,000 |
| 14/ D-0008-0009 | අනුර බණ්ඩාර මයා | 33-5084 | 2,000 |
| 14/ D-0010,0250 | ශාන්ති අමරසේකර මයා | 33-5141 | 2,000 |
| 14/ D-0280-0282 | පි.ජ්.ජයරත්න මයා | 33-5157 | 2,000 |
| 536 | ජ්.එස්.ඉඹුලාන මිය | 03-713 | 2,000 |
| KETA -537 | සෝමා දීගල්ල මිය. | 27-4211 | 2,270 |
| KETA 0535 | පූර්ණිමා සඳමාලි මිය. | 30-4643 | 2,500 |
| 14/A-5526-5575 | අමරා වන්නිආරච්චි මිය. | 30-4631 | 2,500 |
| 14/A-16101-16150 | එස්.ජයසිංහ මිය. | 32-5577 | 2,500 |
| 14/A-17351-17375 | ජයවතී පෙරේරා මිය. | 32-4876 | 2,500 |
| 14/A-13776-13800 | අනුරාධි හපුතන්ත්‍රී මිය. | 32-4910 | 2,500 |
| 14/A-14026-14050 | ආර්.ජ්.එස්.ප්‍රදීපා මිය. | 32-4984 | 2,500 |
| 14/A-9551-9575 | ජෙ.ජ්.දයාවතී මිය. | 12-2194 | 2,500 |
| 14/A-13801-13825 | අයිරාංගනී ගුණරත්න මිය. | 32-4985 | 2,500 |
| 14/A-16351-16375 | මධුෂානි පෙරේරා මිය. | 32-4975 | 2,500 |
| 14/A-16801-16825 | එස්.පී.ජයන්ත මයා. | 32-4974 | 2,500 |
| 14/A-10651-10675 | පි.ගුණරත්න මයා | 31-4798 | 2,500 |
| 14/A-1351-1375 | ජී.හෙන්රි මයා. | 28-4223 | 2,500 |
| 14/A-1251-1275 | ප්‍රියංකා බර්නඩේක් මිය | 29-1704 | 2,500 |
| 14/A-14001-14025 | ජ්.ඩී.සුසිලාවතී මිය | 31-4825 | 2,500 |
| 14/A-16701-16725 | රම්‍යලතා රූපකාන්ති මිය. | 32-4905 | 2,500 |
| 14/A-16851-16875 | නිලංගනී මිය. | 32-4938 | 2,500 |
| 14/A-9501-9525 | ජී.ජ්.ජේ.පී.ජයවර්ධන මිය. | 31-4818 | 2,500 |
| 14/A-17576-17595 | අජන්ත රණසිංහ මයා. | 32-4899 | 2,500 |
| 14/A-13701-13725 | අනුරාධි හපුතන්ත්‍රී මිය. | 32-4910 | 2,500 |
| 14/A-14051-14075 | දර්ශන හේරත් මයා. | 32-4939 | 2,500 |
| 14/A-13851-13875 | සන්ධ්‍යා පීරිස් මිය. | 32-4967 | 2,500 |
| 14/A-16201-16225 | ඉන්ද්‍රානි පස්යාල මිය. | 31-4764 | 2,500 |
| 14/A-16601-16625 | සුජානි චතුරිකා මිය. | 32-5027 | 2,500 |
| 14/A-10601-10625 | ධර්ම ගුණවර්ධන මයා | 31-4695 | 2,500 |
| 14/A-15726-15750 | ප්‍රියානි ධර්මවර්ධන මිය | 32-4927 | 2,500 |
| 14/A-17001-17025 | කේ.එස්.චන්ද්‍රකාන්ති මිය | 32-4957 | 2,500 |
| 14/A-17226-17250 | තිලංකා සඳමාලි මිය | 32-5025 | 2,500 |
| KETA -543 | ඩී.බෝයගොඩ සහ අයි.ජයකොඩි | 33-5046 | 2,500 |
| 14/A-16976-17000 | එස්.එම්.අයි.ජේ.ප්‍රියංක මයා | 32-4972 | 2,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| | ඩබ්.ජී.ජී.එන්.එම්.මැණිකේ මිය | 32-4973 | 2,500 |
| 14/A-17901–17925 | නන්දා මනම්පේරි මිය | 33-5189 | 2,500 |
| 14/A-17751-17775 | රසික රණතුංග මයා | 33-5140 | 2,500 |
| 14/A-16501-16525 | නවෝද චන්දිමාල් මයා | 32-4923 | 2,500 |
| 14/A-18126-18150 | තිලින මදූෂාන් මයා | 33-5205 | 2,500 |
| 14/A-18051-18075 | රන්ජය ගුණවර්ධන මයා | 33-5206 | 2,500 |
| 14/A-17776-17800 | එම්.ඩබ්.මනෝජ් මයා | 33-5175 | 2,500 |
| 14/A-18251-18275 | වත්සලා ලක්මිණි මිය | 33-5050 | 2,500 |
| 14/A-18551-15575 | ඩී.බෝයගොඩ | 33-5046 | 2,500 |
| 14/A-18526-18550 | නන්දා මනම්පේරි මිය | 33-5189 | 2,500 |
| 14/A-10525-10550 | ප්‍රසාද් අබේසිංහ මයා | 27-4130 | 2,500 |
| 14/A-19101-19125 | කැටපෙආරච්චි මයා | 33-5056 | 2,500 |
| 14/A-17701-17725 | තනුජා හෙටිආරච්චි මිය | 01-260 | 2,500 |
| 14/A-17926-17950 | පිරෝන් ඉන්දික මයා | 33-5071 | 2,500 |
| 14/A-12626-12650 | එරන්ද බුද්ධිකුමාර මයා | 30-4637 | 2,500 |
| 14/A-18351-18375 | ගයනි සේනානායක මිය | 33-5170 | 2,500 |
| 14/A-18026-18050 | ආර්.කේ.චන්ද්‍රානි මිය | 33-5173 | 2,500 |
| 14/A-17676-17700 | එස්.පී.එල්.චන්ද්‍රතුංග මයා | 33-5168 | 2,500 |
| 14/A-18576-18600 | ඩී.බෝයගොඩ මයා | 33-5046 | 2,500 |
| 14/A-17876-17900 | ක්‍රිෂාන්ති ගුණවර්ධන මිය | 33-5105 | 2,500 |
| 14/A-18526-18550 | එච්.කරුණාතිලක මයා | 33-5129 | 2,500 |
| KETA-0544 | ඩී.අමරසිරි සිල්වා මයා | | 2,500 |
| KETA-0545 | කේ.එච්.කරුණාතිලක ද සිල්වා මයා | | 2,500 |
| KETA -538 | අමල් සිරි ද සිල්වා මයා. | 32-4913 | 3,000 |
| 14/E-0123 | එච්.එම්.ඩිංගිරිඅම්මා | | 5,000 |
| 14/E-0026 | නුවන් චතුරංග මයා. | 04-822 | 5,000 |
| 14/E-0027 | මාධවී හේරත් මිය | 32-5006 | 5,000 |
| 14/A-13651-13700 | යසකීර්ති බණ්ඩාර මයා | 32-4879 | 5,000 |
| 14/E-0028 | දර්ශන ගලපත්ති මයා | 30-4686 | 5,000 |
| 14/E-0030 | සමිත කරුණාරත්න මයා | 32-4949 | 5,000 |
| 14/E-0029 | සි.ටී.ජිනදාස මයා | 32-5006 | 5,000 |
| 14/E-0091 | ටී.ආර්.පී.හේරත් | | 5,000 |
| 14/A-17626-17675 | පී.කරුණාරත්න මිය | 32-4996 | 5,000 |
| 14/A-18301-18350 | බණ්ඩාර පතිරණ මයා | 33-5136 | 5,000 |
| 14/A-16501-16100 | එස්.ආර්.හෙටිආරච්චි මිය | 32-4925 | 5,000 |
| 14/E-0092 | ජ්.ඩබ්.එස්.චාන්දනී මිය | 33-5057 | 5,000 |
| 14/E-0093 | එම්.එම්.කරුනාධර්ම මිය | 33-5101 | 5,000 |
| 14/E-0094 | ජේ.එම්.එස්.පී.ජයසේකර මිය | 27-4138 | 5,000 |
| 14/E-0095 | ඩබ්.එම්.සී.පෙරේරා මිය | 18-2952 | 5,000 |
| 532 | නිලූෂා සේනානායක මිය | 31-4783 | 6,000 |
| 530 | ලීලා ත්‍රිමාවිතාන මිය | | 7,600 |
| 529 | සුගතවංස මයා | | 8,000 |
| 14/ F-0056 | ප්‍රියංක මෙන්ඩිස් මයා. | 13-223 | 10,000 |
| 14/ F-0112 | කුමාර චන්ද්‍රරත්න මයා | 32-4874 | 10,000 |
| 14/ F-0057 | සමන් ද සිල්වා මයා. | 32-4945 | 10,000 |
| 14/ F-0058 | රොහාන් සූරියආරච්චි මයා | 32-4880 | 10,000 |
| 14/E-0124-0125 | ප්‍රදීප් මයා - මහියංගනය | | 10,000 |
| 535 | අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමියන් වහන්සේ | | 10,000 |
| 14/E-0131-0132 | පි.රණසිංහ මයා | | 10,000 |
| 14/F-0113 | ඉන්දිකා උෂානි මිය | 30-4608 | 10,000 |
| 14/F-0114 | ඩී.ගයෂාන් මයා | 32-4970 | 10,000 |
| KETA 0401-0406 | ප්‍රදීප් මයා - මහියංගනය | | 10,630 |
| 14/A-17451-17575 | ආර්.ආර්.ගමගේ මිය | 32-4886 | 12,500 |
| KETA 0299-300 | ප්‍රදීප් මයා - මහියංගනය | | 13,170 |
| 14/E-0133-0135 | එල්.එම්.සී.ශ්‍රියාලතා මිය | | 15,000 |
| 531 | සුගතවංස මයා සහ එම මහත්මිය | | 17,650 |
| 14/I-0008 | මියුරුලතා ගුණතුංග මිය | | 25,000 |
| 538 | අතිපූජ්‍ය අහංගම ධම්මාරාම නාහිමියන් වහන්සේ | | 35,500 |
| 14/H-0004 | ශ්‍යාමා පෙත්තාවඩු මිය. | 17-2817 | 50,000 |
| 537 | කමලා වඩුගොඩපිටිය මිය සහ අශෝක මහදිවුල්වැව මයා | | 50,000 |
| 14/G-0017 | හර්ෂ පෙරේරා මයා. | | 100,000 |
| 14/G-0018 | පද්මා පුංචිහේවා මිය. | 22-3492 | 100,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. | ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 14/G-0020 | ජනිත් රූපසිංහ මයා ඇතුළු පවුලේ සියලූ දෙනා | 33-5214 | 100,000 | 14/G-0034 | ධයනි නවෝදි හෙට්ටිආරච්චි මෙනවිය | | 100,000 |
| | | | | 14/G-0035 | ඩී.රමණී කුරුප්පු මිය | 23-3548 | 100,000 |
| 14/G-0031 | ගයාත්‍රි මහදිවුල්වැව ප්‍රේමරත්න මිය | | 100,000 | 14/G-0036 | ඉල්මා ජිනේන්ද්‍ර ජයසිංහ මිය | 33-5208 | 100,000 |
| 14/G-0032 | කේ.ජ්.සී.පෙරේරා මයා සහ හර්ෂ පෙරේරා මයා | 32-4898 | 100,000 | 533 | ජ්.යූ.අකුරටියගමගේ මයා | | 111,111.11 |
